:- 2003/15


ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் திணைக்களம்
LAND COMMISSIONER'S DEPARTMENT

නො.7, ග්‍රෙගරි මාවත ,කොළඹ 07
இல 7, கிரகரீஸ் வைவீதி, கொழும்பு 07
No.7 , Gregory's Avenue, Colombo 07

ෆැක්ස් / தொலைநகல் / Fax : 684051
ඊමේල් / மின்னஞ்சல் / E-mail : Landcom@sltnet.lk


මගේ අංකය / எனது இல / MY NO : 4/10/චක්‍රලේඛ/2003/15
ඔබේ අංකය / உமது இல / YOUR NO :
දිනය / திகதி / DATE : 2003-12-11

22 DEC 2003

සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන්,

**නිවාස සඳහා දීර්ඝකාලීන බදු යටතේ බෙදා දුන් රජයේ ඉඩම් සඳහා දීමනාපත්‍ර නිකුත් කිරීම**

"දීර්ඝකාලීන බදුකර ලබාදීමට අදාල නිර්දේශ ඉදිරිපත් කිරීම" මාතෘකාවට අදාළව මගේ සමාංක හා 2003.09.26 දිනැති 2003/12 දරණ චක්‍රලේඛයට ඔබගේ කාරුණික අවධානය මින් යොමු කරමි.

"නිවාස සඳහා රජයේ ඉඩම් බෙදා දීම හා පැවරීම " මාතෘකාව යටතේ නිවාස තැනීම සඳහා රජයේ ඉඩම් බෙදා දීමේ දි සම්මත ප්‍රමාණයක් නිශ්චය කිරීම පිණිස, ඉඩම් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 1994.12.06 දිනැති අංක 94/8 දරණ චක්‍රලේඛයෙහි 04 වන ජේදය යටතේ දැක්වෙන සීමාවන් ගරු ඉඩම් අමාත්‍යතුමා විසින් වර්තමානයේ ප්‍රකාශයට පත්කර ඇති ආකාරයට පහත දැක්වෙන පරිදි සංශෝධනය විය යුතුය.

ඒ අනුව නිවාස අරමුණු සඳහා අලුතින් ඉඩම් බෙදා දීම හෝ නීත්‍යානුකූල කිරීම කරන අවස්ථාවලදී

1. මහ නගරසභා සීමාව තුළ පර්චස් 06කට සීමා විය යුතුය.
2. නගරසභා සහ සංවර්ධන ප්‍රදේශ තුළ උපරිම සීමාව පර්චස් 10ක් විය යුතුය.
3. ප්‍රාදේශිය සභාවල උපරිම ප්‍රමාණය පර්චස් 20ක් විය යුතුය.

මෙම සීමාවන් යටතේ කටයුතු කළයුතු වනුයේ අලුතින් බෙදා දෙනු ලබන හෝ අනවසර නියමානුකූල කිරීම යටතේ දැන් තීරණ ගනු ලබන ඉඩම් සඳහා පමණි.

සැලසුම් කළ නගරවල සහ දැනටමත් ඉඩම් කච්චේරි, ප්‍රසිද්ධ වෙන්දේසි , ටෙන්ඩර් මගින් පුද්ගලයන් තෝරාගෙන ඇති අවස්ථාවල මෙම සීමාවන් බල නොපැවැත් විය යුතුය. එසේම දැනටමත් බලපත්‍ර ලබා දී ඇති ඉඩම් සඳහාද මෙම සීමාවන් බලපානු නොලබයි.

ඉහත සඳහන් 1994.12.06 දිනැති 94/8 දරණ චක්‍රලේඛයෙහි 05 ජේදයෙහි දැක්වෙන ආකාරයට අනුරාධපුර නගරය තුළ ඉඩම් කට්ටි කැඩීමේ සැලසුම මත දැනටමත් බෙදා දී ඇති බිම් කට්ටි පැවරීම සඳහා එම චක්‍රලේඛයෙහි දැක්වෙන උපදෙස් තවදුරටත් වලංගු කරගත යුතු අතර, නගර සැලසුමෙන් පිටත නිවාස අරමුණු සඳහා බෙදා දෙනු ලබන හෝ අනවසර නියමානුකූල කිරීම් කරනු ලබන ඉඩම් සඳහා නව සීමාවන් අදාළ කරගත යුතු බව කාරුණිකව දන්වමි.

එස්.ජේ.පතිරණ
ඉඩම් කොමසාරිස්.

පිටපත්:- 1. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය.
2. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්.
3. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්.
4. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාලවල සියලුම මාණ්ඩලික නිලධාරීන්.

'04/01/06